අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education
'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்லை, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 · +94112785818
info@moe.gov.lk · www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/02/29/02/02/06/01

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2026.09. 18

**චක්‍රලේඛ අංක 31/2023 (I)**

සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
සියලුම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන්
සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන්
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන්

<u>ගුරුවරුන්ගේ කාර්යක්ෂමතා කඩඉම් සඳහා සහන ලබා දීම</u>

අංක 2444/21 හා 2025.07.08 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද සංශෝධිත ගුරු ව්‍යවස්ථා ප්‍රකාරව කාර්යක්ෂමතා කඩඉම් විභාග ක්‍රමය හඳුන්වා දීම හේතුවෙන්, ජාතික හා පළාත් පාසල් හි සේවය කරන ගුරු සේවයේ නිලධාරින්හට පෙර පැවති මොඩියුල ක්‍රමයට අදාළව තවදුරටත් කාර්යක්ෂමතා කඩඉම් සම්පූර්ණ කිරීමට පැවති අවහිරතා සළකා මෙම අමාත්‍යාංශය විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් කරන ලද ඉල්ලීම් සම්බන්ධයෙන් එම කොමිෂන් සභාව විසින් පහත පරිදි සහන ලබා දීමට තීරණය කරන ලද බව රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/EST/02-05/05/2020 හා 2026.09.07 දිනැතිව මෙම අමාත්‍යාංශය වෙත දන්වා ඇත;

I. 2022.10.23 දින සිට 2025.06.30 දින දක්වා කාලය තුළ ගුරු සේවයේ I ශ්‍රේණියට උසස්වීම යෙදෙන ගුරුවරුන්, කාර්යක්ෂමතා කඩඉම් III සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීමටත්;

II. තමා උසස් වූ ශ්‍රේණියට පූර්වයෙන් සම්පූර්ණ කල යුතු කාර්යක්ෂමතා කඩඉම ද ඊළඟ ශ්‍රේණි උසස්වීම් දිනට පෙර සම්පූර්ණ කිරීමේ කොන්දේසිය මත මේ දක්වා උසස් වීම් ලද ගුරුවරුන් එකී පූර්ව ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීමටත්; හා

III. 2025.06.30 දින සිට පහත පරිදි තමන් අයත් ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වෙන දිනය යන දින අතර කාලය තුළ ශ්‍රේණි උසස්වීම් යෙදෙන නිලධාරීන්ට මොඩියුල/ කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්පූර්ණ කිරීම නොසළකා ශ්‍රේණි උසස්වීම් ලබා දීමට කටයුතු කිරීමත්;

   i. පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා අංක 2494 හා 2026.06.19 දිනැති ගැසට් පත්‍රය අනුව;
   ii. දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා අංක 2498 හා 2026.06.17 දිනැති ගැසට් පත්‍රය අනුව ද;
   iii. තෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා අංක 2503 හා 2026.08.21 දිනැති ගැසට් පත්‍රය අනුව ද;

02. ඉහත 01. III හි සඳහන් තමන් අයත් ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගය පැවැත්වීමට නියමිත දිනෙන් පසුව ඊළඟ ශ්‍රේණි උසස්වීම යෙදෙන නිලධාරීන් තම ශ්‍රේණි උසස්වීම ලබා ගැනීම සඳහා නියමිත පරිදි කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්පූර්ණ කළ යුතුය. එහෙත් එවැනි නිලධරයන් ඊළඟ

ගරු අමාත්‍යතුමිය / கௌரவ அமைச்சர் / Hon. Minister — +94112784832 · +94112784825 · minister.education@moe.gov.lk
ලේකම් / செயலாளர் / Secretary — +94112784811 · +94112785162 · secretary.education@moe.gov.lk

ශ්‍රේණි උසස්වීමට අදාළ මොඩියුල මේ වන විටත් සම්පූර්ණ කර ඇත්නම් ඔවුන් නැවත කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්පූර්ණ කිරීම අවශ්‍ය නොවන අතර නියමිත දිනට අදාළ ශ්‍රේණි උසස්වීම ලැබීමට හිමිකම් ලබයි.

03. ඒ අනුව උක්ත රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණය අනුව අධ්‍යාපන චක්‍රලේඛ 31/2023 හි 2 ii හා iii ඡේදයන් වෙනුවට මෙම චක්‍රලේඛයේ විධිවිධාන බලපැවැත්වෙන බව සළකා කටයුතු කරන ලෙසත්; මෙම විධිවිධාන ගුරු සේවයේ නිලධාරීන් සඳහා අදාළ වන බැවින් දිවයිනේ සියලුම ජාතික හා පළාත් පාසල් හි සේවය කරන විදුහල්පතිවරුන් මඟින් සියලුම ගුරුසේවයේ නිලධාරීන් මෙම චක්‍රලේඛය සම්බන්ධයෙන් නොපමාව දැනුවත් කිරීමට ද අවශ්‍ය කටයුතු කරන ලෙසත් කාරුණිකව දන්වමි.

04. තව ද, උක්ත 01.III ඡේදය මඟින් දක්වන ලද සහනය ලබා දීමේදී උක්ත ගැසට් නිවේදනයන් ප්‍රකාරව කාර්යක්ෂමතා කඩඉම් I,II හා III විභාග ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පැවැත්වීමට නියමිත දිනය කාර්යක්ෂමතා කඩඉම් සහන ලබා දීම සඳහා සළකා බැලිය යුතු දිනය ලෙස අදාළ කර ගත යුතුය.

05. උක්ත උපදෙස් අනුව අදාළ කාර්යක්ෂමතා කඩඉම් නිදහස් කිරිමටත් නියමිත උසස්වීම් ලබාදීමත් සිදුකිරීමට කටයුතු කරන ලෙස වැඩි දුරටත් දන්වා සිටිමි.

ජේ.ජේ.එස්.එස්.එදිරිසූරිය
ලේකම් (වැ.බ)

පිටපත්

1. ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව - කරු.දැ.ගැ.ස.
2. සියලුම ආණ්ඩුකාර ලේකම්වරුන් - කරු.දැ.ගැ.ස.
3. අතිරේක ලේකම් (පිරිවෙන් අධ්‍යාපන), අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස.
4. අතිරේක ලේකම් (පාසල් කටයුතු), අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස.
5. අධ්‍යක්ෂ (ගුරු අධ්‍යාපන පරිපාලන), අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස.